# ගණිතය

## පළමුවන ශ්‍රේණිය


### තුන්වන වාරය

ගුරු මාර්ගෝපදේශයට අනුව සම්පාදිතයි

**සැකසුම : බස්නාහිර පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව**



# 1 සිට 9 තෙක් ක්‍රම සූචක සංඛ්‍යා හඳුනා ගැනීම



**ක්‍රියාකාරකම 01:** කීවෙනියා දැයි බලමු

**සපයා ගත යුතු දේ -**

- පාඩම අවසානයේ ඇති සත්ත්ව රූප 9 කපා ගන්න.
- බිම තැබිය හැකි පරිදි කුඩා ලී කුට්ටි / යෝගට් කෝප්ප / ඉවතලන ගිනිපෙට්ටිවල එම රූප එකින් එක රූපයේ පරිදි අලවාගන්න.



**දෙමාපියන්ට උපදෙස් -**

- එම සත්ත්ව ආකෘති එකම දිශාවකට සිටින පරිදි කැමති ආකාරයකට එකෙකු පිටුපස අනෙකා සිටින පරිදි එක පෙළට  තැබීමට දරුවා යොමු කරන්න .
- ඉන්පසු පළමුවෙනියා, දෙවෙනියා, තුන්වෙනියා, හතරවෙනියා, පස්වෙනියා, හයවෙනියා, හත්වෙනියා, අටවෙනියා, නවවෙනියා ලෙස දරුවාට සතුන් පෙන්වමින් කීමට යොමු කරන්න.
- එය හඳුනාගත් පසු පහත ප්‍රශ්න දරුවාගෙන් අසන්න . පිළිතුරු ලබා ගන්න. පිළිතුර නිවැරදි විය යුතුනම් පිළිතුර නිවැරදි කරවන්න.
  - ✓ පළමුවෙනියාට ඉන්නේ කවු ද?
  - ✓ හාවා ඉන්නේ කී වෙනියාට ද?
  - ✓ පස්වෙනියාට ඉන්නේ කවු ද?
  - ✓ අන්තිමයාට ඉන්නේ කවු ද?
  - ✓ අන්තිමයා කී වෙනියා ද?
  - ✓ අලියා කී වෙනියා ද?

**ක්‍රියාකාරකම 02** - කතන්දරයක් අසමු .

- ඉහත ක්‍රියාකාරකම 01 හි භාවිත කළ සත්ත්ව ආකෘති මේ සඳහා ද භාවිත කරන්න .
- පහත කතන්දරය දරුවාට පවසන්න.
- "කැලේ යාළුවන් වූ හාවයි, ඉබ්බයි , ඉත්තෑවයි, බලුපැටියයි, පූසයි, මීයයි, අලිපැටියයි, තාරාපැටියායි, වහුපැටියායි සෙල්ලම් කරන්න පිට්ටනියට ආවා. "අපි තරගෙට දුවමු" කියලා බලුපැටියා කිව්වා. හැමෝම තරගෙට දුවන්න කැමති වුණා. "මම එකයි දෙකයි තුනයි කියලා ගණන් කරන්නම්" කියලා ඉබ්බා කිව්වා. එකයි දෙකයි තුනයි කියලා තරගය පටන් ගත්තා. දැන් එක්කෙනා පසු පස එක්කෙනා වේගයෙන් දුවනවා."
- කතන්දරය කියන අතර ඒ ඒ ස්ථානවල සත්ත්ව ආකෘති තැබීමට දරුවා යොමු කරන්න.

✓ පළමුවෙනියාට දුවන්නේ බලුපැටියා
✓ දෙවෙනියාට දුවන්නේ හාවා
✓ තුන්වෙනියාට දුවන්නේ පූසා
✓ හතරවෙනියාට දුවන්නේ මීයා
✓ පස්වෙනියාට දුවන්නේ අලිපැටියා
✓ හයවෙනියාට දුවන්නේ ඉත්තෑවා
✓ හත්වෙනියාට දුවන්නේ වසුපැටියා
✓ අටවෙනියාට දුවන්නේ තාරාපැටියා
✓ නවවෙනියාට දුවන්නේ ඉබ්බා

දැන් ඔක්කොම සත්තු වේගයෙන් දුවනවා . ඔන්න එකපාරටම හාවා පළවෙනියා වුණා. හතරවෙනියාට හිටපු මීයා දෙවෙනියාට දුවන්න ගත්තා. අන්තිමට දුවපු ඉබ්බා තාරපැටියාව පහු කරලා අටවෙනියා වුණා. ඔන්න ඒ විදියට දිනුම් කණුව පසු කළා.

- කතන්දරය නිම වූ පසු දැන් සතුන් සිටින ස්ථාන පිළිබඳ ව දරුවාගෙන් පහත ප්‍රශ්න අසන්න.
  1. පළමුවෙනි ස්ථානය ගත්තේ කවු ද ?
  2. දෙවෙනි ස්ථානය ගත්තේ කවු ද?
  3. ඉබ්බා සිටින්නේ කීවෙනි ස්ථානයේ ද?
  4. අනෙක් සතුන් ඉන්නේ කුමන ස්ථානවල ද ?

**ක්‍රියාකාරකම 03** :- වාහන එලවමු .

සපයා ගත යුතු දේ

- පහත දේවල්වලින් ඔබට පහසුවෙන් සපයා ගත හැකි දේ තෝරා ගන්න.
  - ✓ සෙල්ලම් වාහන හෝ
  - ✓ ඉවතලන හිස් සබන් පෙට්ටි / දත් බෙහෙත් පෙට්ටි ආදියෙන් සකස් කරගත් වාහන ආකෘති 09 ක්

**දෙමාපියන්ට උපදෙස් -**

- වාහන එකක් පසුපස එකක් එක දිශාවකට තබා ඒවා පිහිටි ස්ථාන පිළිබඳ පැහැදිලි කරදීමට දරුවාගෙන් පහත ප්‍රශ්න අසන්න .


1. පළමුවෙනියාට යන්නේ කුමන වාහනය ද ?
2. වාහනයක් නම් කර ( බසය ) යන්නේ කීවෙනියාට ද?
3. පස්වෙනියාට යන්නේ කුමන වාහනය ද ?

---




*ගණිතය වැඩ පොතේ පිටු අංක 50,51,52 හි අභ්‍යාස සඳහා දරුවාට මඟ පෙන්වන්න.*

---








# වස්තු තුනක උස / දිග සැසඳීම



**ක්‍රියාකාරකම 01 : උස ම කවුදැයි සොයමු.**

**දෙමාපියන්ට උපදෙස් -**

- ඔබේ නිවසේ සිටින සාමාජිකයන් තිදෙනෙකු ඇසුරෙන් උස සංසන්දනය කිරීමට මේ ක්‍රියාකාරකමෙහි යෙදෙන්න.
- නිවසේ සාමාජිකයින් තිදෙනා පෙළට සිටුවන්න .
  - ✓ උස ම කවු ද?
  - ✓ මිටි ම  කවුද ? යන්න විමසන්න.
- උස අනුව ගෙදර සිටින අය ඇඳීමට යොමු කරන්න .

**ක්‍රියාකාරකම 02** :-   උසම බෝතලය සොයමු.

**සපයා ගත යුතු දේ - එකම වර්ගයේ එකිනෙකට උස වෙනස් බෝතල් තුනක් සොයා ගන්න.**

**දෙමාපියන්ට උපදෙස් -**

- එම බෝතල් සමතලා ස්ථානයක තබන්න.
- බෝතල්වල උස සංසන්දනය සඳහා දරුවාගෙන් පහත ප්‍රශ්න අසා  පිළිතුරු ලබාගන්න.
  - ✓ උස ම බෝතලය පෙන්වන්න.
  - ✓ මිටි ම බෝතලය පෙන්වන්න
- මිටි ම බෝතලයේ සිට උස ම බෝතලය දක්වා අනුපිළිවෙළට තැබීමට දරුවා යොමු කරන්න.
- එය අභ්‍යාස පොතක හෝ කොළයක ඇඳීමට කියන්න.

**ක්‍රියාකාරකම 03** :- උස ම කොඩිය සොයමු .

**දෙමාපියන්ට උපදෙස්**

- අපතේ යන පත්තර කොළ හෝ කැලැන්ඩර කොළ මඟින් එකම ප්‍රමාණයේ කොඩි තුනක් කපා ගන්න.
- උස එකිනෙකට වෙනස් ඉරටු තුනක කොඩි අලවා ගන්න.

- වැලි පිරවූ එකම ප්‍රමාණයේ පොල්කටු තුනක හෝ තරමක් ලොකු භාජනයක වැලි පුරවා කොඩි තුනම රඳවාගන්න
- දරුවාගෙන් පහත ප්‍රශ්න අසන්න.
    - ✓ උස ම කොඩිය පෙන්වන්න.
    - ✓ මිටි ම කොඩිය පෙන්වන්න.
- උස අඩු ම කොඩියේ සිට වැඩි ම කොඩිය දක්වා අනුපිළිවෙළට තැබීමට කියන්න.
- උස වැඩි ම කොඩියේ සිට උස අඩුම කොඩිය දක්වා ද අනුපිළිවෙළට තැබීමට කියන්න.

## දිග සසඳමු .

**ක්‍රියාකාරකම 04** :- දිග ම කොළය සොයමු .

**දෙමාපියන්ට උපදෙස් -**

- තම ගෙවත්තෙන් සොයා ගත හැකි දිගින් අසමාන දිගටි හැඩයේ ශාකපත්‍ර තුනක් සොයා ගන්න. නටුව ඉවත් කරන්න. (අඹ , අරලිය, ගිනිකුරු ,කෝපි වැනි)
- සිමෙන්ති පොළොවේ / බිම රේඛාවක් අඳින්න.
- රූපයේ පරිදි එම රේඛාවේ සිට ආරම්භ වන පරිදි කොළ තුන තබන්න.




- ✓ පහත දේ පෙන්වීමට දරුවාට කියන්න
- ✓ දිග ම කොළය
- ✓ කොට ම කොළය

- කොට ම කොළයේ සිට දිග ම කොළය දක්වා අනුපිළිවෙළට තැබීමට කියන්න.

**ක්‍රියාකාරකම 04** :- දිගම වැල  හදමු.


**දෙමාපියන්ට උපදෙස් -**

- තම ගෙවත්තේ ගස්වලින් වැටුණු කොස් කොළ හෝ පේර කොළ වැනි එකම වර්ගයක කොළ හා ඉරටු කැබලි (අඟල් එක) කීපයක් සපයා ගන්න.
- එම කොළ ඉරටු කැබලිවලින් එකිනෙක අමුණා ගනිමින් කොස් කොළ වැල් කීපයක් සකස් කරගන්න.
- සකස් කර ගත් වැල් රූපයේ පරිදි බිම අඳින ලද රේඛාවක එක කොනක් පිහිටන පරිදි තැබීමට දරුවා යොමු කරන්න.




- ඒ ඇසුරින් ප්‍රශ්න අසමින් වැල්වල දිග සංසන්දනයට යොමු කරන්න.
  - ✓ දිග ම වැල තෝරන්න .
  - ✓ කොට ම වැල තෝරන්න.
- දිග ම වැලේ සිට කොට ම වැල දක්වා අනුපිළිවෙළට තැබීමට යොමු කරන්න.
- කොස් කොළ හෝ පේර කොළ වැනි දෙයක් සොයා ගැනීමට නොහැකි නම් කඩදාසිවලින් දම්වැල් තුනක් සාදාගන්න.
- දිග ම දම්වැලේ සිට කොට ම දම්වැල දක්වා අනුපිළිවෙළට තැබීමට යොමු කරන්න

| |
|---|
| ගණිතය වැඩ පොතේ පිටු අංක 53,54,55,56 හි ඇති අභ්‍යාස සඳහා මඟ පෙන්වන්න |



# එකතුව 6 තෙක් සංඛ්‍යා දෙකක් එකතු කිරීම.



# එකතුව සොයමු

**සපයා ගත යුතු දේ-**

ඔබට පහසුවෙන් සපයා ගත හැකි දේවල් තෝරා ගන්න.

- පිරිසිදු කර ගත් කුඩා ගල් කැට 6ක්
- ඇට වර්ගයකින් 6 ක්
- එකම වර්ගයේ මල් 6 ක් (එකම පාට)
- බෝතල් මූඩි 6ක්
- බොත්තම් 6 ක්
- කුඩා පෙට්ටියක් ,කෝප්ප 2 ක්

**ක්‍රියාකාරකම 1**

**දෙමාපියන්ට උපදෙස්-**

- සපයා ගත් එක් ද්‍රව්‍යයකින් ක් 6 කුඩා පෙට්ටියකට දමන්න.
- දරුවා ඉදිරියේ කෝප්ප 2 තබන්න.
- පෙට්ටියේ ඇති ද්‍රව්‍යවලින් කැමති ද්‍රව්‍ය ගණනක් ගණන් කරමින් එක් කෝප්පයකට දැමීමට දරුවාට කියන්න.
- ඉතුරු ටික අනෙක් කෝප්පයට දැමීමට කියන්න.
- දැන් කෝප්ප දෙකට ම දැමූ ද්‍රව්‍ය වෙන වෙන ම ගණන් කිරීමට කියන්න. ඉන්පසු ඒවා එක ගොඩකට දමා නැවත ගණන් කිරීමට කියන්න. පහත ආකාරයෙන් ප්‍රකාශ කරන්න

| |
|---|
| එකක ගල් කැට 2යි. අනෙකෙහි ගල් කැට 4යි. ඔක්කොම ගල් කැට 6යි. |


- දරුවාට ද කෝප්ප දෙකෙහි ඇති ද්‍රව්‍ය පෙන්වමින් එසේ ප්‍රකාශ කිරීමට උපදෙස් දෙන්න.

**ක්‍රියාකාරකම 2**

- වෙනත් වර්ගයකින් ද්‍රව්‍ය 6ක්, මේ සඳහා තෝරා ගන්න .ඒවා පෙට්ටියට දමන්න.
- පෙර ලෙසම කෝප්ප2 ට තමා කැමති ද්‍රව්‍ය ප්‍රමාණ දැමීමට දරුවාට උපදෙස් ලබා දෙන්න.
- ද්‍රව්‍යවල එකතුව ලබා ගත් ආකාරය ,ඉහත පැහැදිලි කළ අයුරින් ප්‍රකාශ කිරීමට දරුවාට අවස්ථාව ලබා දෙන්න.
- ඉහත ක්‍රියාකාරකම1හි සඳහන් කළ ආකාරයට ද්‍රව්‍ය වෙනස් කරමින් එම ක්‍රියාකාරකමෙහි කිහිප වාරයක් යෙදීමට දරුවාට අවස්ථාව ලබා දෙන්න .

**ක්‍රියාකාරකම3**

- පහත රූප පත්‍රිකා බලන්න.




මල් 2 යි මල් 2 යි

- රූප පත්‍රිකා දෙස හොඳින් බලමින් වචන කියවීමට දරුවාට කියන්න.
- කඩදාසිවලින් කපාගත් මල් රූප මත තබා ගණන් කරවන්න
- ඔක්කොම මල් කීයදැයි ගණන් කර බලන ලෙසට කියන්න.
- එම මල් ගණන හිස් කොටුවෙහි තැබීමට ඉඩ දෙන්න.
- දරුවා කැමති නම් රූප ඇඳීමට දෙන්න.

**ක්‍රියාකාරකම 4**

පහත රූප පත්‍රිකා දෙස හොඳින් බලන්න .



පහත අයුරින් අදාළ රූපය බොත්තම් ( හෝ ඕනෑම කුඩා ද්‍රව්‍යයක්)

තබමින් ගණන් කරවන්න.

බොත්තම් ...... යි බොත්තම් ................ යි ඔක්කොම............යි


රූප පත්‍රිකා දෙස බලමින් හිස්තැන්වලට සුදුසු සංඛ්‍යා පැවසීමට

දරුවාට අවස්ථාව ලබාදෙන්න.


---

*1 ශ්‍රේණිය ගණිතය වැඩ පොතේ පිටු අංක 58, 59 ඇති අභ්‍යාස කිරීම සඳහා මග පෙන්වන්න.*

---



# සංඛ්‍යාවකට පෙර සංඛ්‍යාව හා පසු සංඛ්‍යාව හඳුනා ගැනීම



**ක්‍රියාකාරකම 01 -** පෙර හා පසු හඳුනා ගනිමු.

**සපයා ගත යුතු දේ -**

- පළමුවෙනියා, දෙවෙනියා ...... හඳුන්වාදීම සඳහා යොදාගත් සතුන්ගේ ආකෘති නැවත භාවිත කරන්න.
- අපතේ යන හිස් පෙට්ටිවලින් ( පිටි පෙට්ටි , සබන් පෙට්ටි) කපා ගත් දිග, පළල අඟල් 2ක ප්‍රමාණයේ කාඩ්පත්වල 1-9 තෙක්

  ඉලක්කම් ලියා ගන්න.

| 1 | 2 | 3 | 4 | 5 | 6 | 7 | 8 | 9 |
|---|---|---|---|---|---|---|---|---|

**ක්‍රියාකාරකම 01 -** පෙර හා පසු ස්ථාන හඳුනා ගනිමු.

- හාවා, පූසා, තාරාවා යන ආකෘති තුන එකම දිශාවට පේළියට තබන්න.
- පහත පරිදි දරුවාගෙන් ප්‍රශ්න අහන්න .
  - ✓ ඉදිරියෙන් සිටින සතා කවු ද ?
  - ✓ මැදින් සිටින සතා කවු ද ?
  - ✓ පිටුපසින් සිටින සතා කවු ද ?
- පූසාට පෙර හාවා සිටින බවත් පූසාට පසු තාරාවා සිටින බවත් දරුවාට කියාදෙන්න .
- පෙර පසු සිටින අය සතුන්ගේ ආකෘති වෙනස් කරමින් තවදුරටත් අහන්න .

**ක්‍රියාකාරකම 02 -** පෙර සංඛ්‍යා සොයමු

**දෙමාපියන්ට උපදෙස් -**

- සකස් කරගත් සංඛ්‍යා කාඩ් තුනක් ගන්න.
- ඒවා පේළියට තබන්න.
- මැද  සංඛ්‍යාව පෙන්වීමට දරුවාට කියන්න.
- මැද සංඛ්‍යාවට පෙර සංඛ්‍යාව පෙන්වීමට කියන්න.
- මැද සංඛ්‍යාවට පසු සංඛ්‍යාව පෙන්වීමට කියන්න.
- නැවත වෙනත් සංඛ්‍යා තුනක් ගන්න.
- එම සංඛ්‍යා ද පේළියට තබන්න.
  - ✓ මැද සංඛ්‍යාවට පෙර සංඛ්‍යාව කුමක් ද ?
  - ✓ මැද සංඛ්‍යාවට පසු සංඛ්‍යාව කුමක් ද?

**ක්‍රියාකාරකම 03 –**

- සකස් කරගත් සංඛ්‍යා කාඩ්පත් අතරින් එකක්  තෝරා ගැනීමට දරුවාට කියන්න.
- එය මේසය මත තැබීමට කියන්න.
- එයට පෙර සංඛ්‍යාව ඉතුරු සංඛ්‍යා කාඩ්පත් අතරින් තෝරා ඉදිරියෙන් තැබීමට කියන්න
- එයට පසු සංඛ්‍යාව ද ඉතුරු කාඩ්පත් අතරින් තෝරා පිටුපසින් තැබීමට කියන්න.
- මේ ආකාරයට තෝරාගත් ඒ ඒ සංඛ්‍යා කාඩ්පත සඳහා පෙර හා පසු සංඛ්‍යා කාඩ්පත් තෝරා තැබීමට තවදුරටත් දරුවාට කියන්න.

**ක්‍රියාකාරකම 04 -**

- කලින් සකස් කරගත් සංඛ්‍යා කාඩ් නවය ම අනුපිළිවෙළට තබන්න .

| | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|
| 1 | 2 | 3 | 4 | 5 | 6 | 7 | 8 | 9 |

- එහි දරුවා කැමති සංඛ්‍යාවක් පෙන්වීමට කියන්න..
- පෙන් වූ සංඛ්‍යාවට පෙර හා පසු සංඛ්‍යාව විමසන්න.
- පහත ප්‍රශ්නවලට සංඛ්‍යා පේළිය ඇසුරින් පිළිතුරු ලබා ගන්න.

✓ 4 ට පෙර සංඛ්‍යාව හා පසු සංඛ්‍යාව කියන්න.

✓ 6 ට පෙර සංඛ්‍යාව හා පසු සංඛ්‍යාව කියන්න.

✓ 7 ට පෙර සංඛ්‍යාව හා පසු සංඛ්‍යාව කියන්න.

✓ 8 ට පෙර සංඛ්‍යාව හා පසු සංඛ්‍යාව කියන්න.


✓ 2 ට පෙර සංඛ්‍යාව හා පසු සංඛ්‍යාව කියන්න.

---

*ගණිතය වැඩ පොතේ පිටු අංක 59,60,61 හි ඇති අභ්‍යාස කිරීම සඳහා මඟ පෙන්වන්න.*

---

# එකතුව 9 තෙක් එකතු කිරීම



## එකතුව සොයමු

**සපයා ගත යුතු දේ-**

ඔබට පහසුවෙන් සපයා ගත හැකි දේවල් තෝරා ගන්න.

- පිරිසිදු කර ගත් කුඩා ගල් කැට 9 ක්
- ඇට වර්ගයකින් 9 ක්
- එකම වර්ගයේ මල් 9ක් (එකම පාට)
- බෝතල් මූඩි 9ක්
- බොත්තම් 9 ක්
- කුඩා පෙට්ටියක්
- 1සිට 5 තෙක් ලියූ සංඛ්‍යා කාඩ්පත්

| 1 | 2 | 3 | 4 | 5 |
|---|---|---|---|---|

**ක්‍රියාකාරකම 1**

**දෙමාපියන්ට උපදෙස්-**

- පෙර පාඩමක දී ද්‍රව්‍ය එකතු කිරීම සඳහා කළ ක්‍රියාකාරකම් පිළිබඳ ව සිහිපත් කරමින් දරුවා සමඟ කතා බහ කරන්න.
- සපයා ගත් එක වර්ගයකින්, ද්‍රව්‍ය 9ක් පෙට්ටියකට දමන්න.
- සංඛ්‍යා කාඩ්පත් මුනින් අතට හරවා මේසය මත තබන්න.
- දරුවාට එයින් එක කාඩ්පතක් ගෙන සංඛ්‍යාව පෙනෙන සේ මේසය මත තැබීමට කියන්න. එම කාඩ්පතෙහි සඳහන් සංඛ්‍යාවට සමාන ද්‍රව්‍ය සංඛ්‍යාවක් පෙට්ටියෙන් රැගෙන කාඩ්පතට යටින් තැබීමට කියන්න.
- වෙනත් සංඛ්‍යා කාඩ්පතක් ගෙන සංඛ්‍යාව පෙනෙන පරිදි මේසය මත තැබීමට කියන්න.
- පෙර පරිදිම කාඩ්පතෙහි සඳහන් සංඛ්‍යාවට සමාන ද්‍රව්‍ය ප්‍රමාණය කාඩ්පත යටින් තැබීමට කියන්න.

- කාඩ්පත් යටින් තබන ලද ද්‍රව්‍ය සංඛ්‍යා එකතු කර පිළිතුර ලබා ගන්නා ආකාරය මෙසේ පැහැදිලි කරන්න.




## ක්‍රියාකාරකම 2

- වෙනත් වර්ගයකින් ද්‍රව්‍ය 9ක් මේ සඳහා යොදා ගන්න.
- ද්‍රව්‍ය 9 පෙට්ටියට දමන්න.
- කාඩ්පත් 5 මුනින් අතට හරවා මේසය මත තබන්න.
- දරුවාට ඉන් එක් කාඩ්පතක් ගෙන මේසය මත තබා එහි සඳහන් සංඛ්‍යාවට සමාන ද්‍රව්‍ය සංඛ්‍යාවක් ගෙන කාඩ්පත යටින් තැබීමට කියන්න.
- තව කාඩ්පතක් ගෙන එහි සඳහන් සංඛ්‍යාවට සමාන ද්‍රව්‍ය සංඛ්‍යාවක් ගෙන කාඩ්පත යටින් තබා ද්‍රව්‍යවල මුළු එකතුව සොයා ඉහත පැහැදිලි කළ ආකාරයට පැවසීමට දරුවාට කියන්න .
- ද්‍රව්‍ය වෙනස් කරමින් ඉහත ක්‍රියාකාරකම්වල සඳහන් කළ ආකාරයට ,එවැනි ක්‍රියාකාරකම්වල කිහිප වාරයක් යෙදෙමින් එකතු කිරීම පිළිබඳ ව අවබෝධය දරුවාට ලබා දෙන්න.

- රූප එකතු කරමින් හිස්තැන්වලට ,ගැළපෙන පිළිතුරු පැවසීමට දරුවාට අවස්ථාව ලබාදෙන්න

3 යි 2 යි එකතුව.යි........................




4 යි 1 යි එකතුව.යි........................




---

*1 ශ්‍රේණිය ගණිතය වැඩ පොතේ පිටු අංක 63 ඇති අභ්‍යාස කිරීම සඳහා මඟ පෙන්වන්න.*

---



# 5 තෙක් වූ ද්‍රව්‍ය සංඛ්‍යාවකින් තවත් ද්‍රව්‍ය සංඛ්‍යාවක් අඩු කිරීම




**ක්‍රියාකාරකම 01 - ඉතුරු ගණන සොයමු**

**සපයා ගත යුතු දේ -**


- ඔබට පහසුවෙන් සපයාගත හැකි රබර් ඇට, සියඹලා ඇට වැනි ඇට වර්ගයක් හෝ යෝගට් හැඳි, මූඩි ආදියෙන් 5 බැගින් හොඳින් පිරිසිදු කර ගන්න
- කුඩා වට්ටියක්, යෝගට් කෝප්පයක් වැනි භාජනයක්

**දෙමාපියන්ට උපදෙස් -**

- සපයා ගත් ද්‍රව්‍ය 5ක් භාජනයට දමන්න.
- එහි ඇති ද්‍රව්‍ය ප්‍රමාණය ගණන් කිරීමට දරුවාට කියන්න.
- ඊළඟට භාජනයෙන් ද්‍රව්‍ය කීපයක් ඉවත් කිරීමට  කියන්න.
- "දැන් වට්ටියේ ඇති ඉතුරු ද්‍රව්‍ය ගණන කීයද?" යි අහන්න.
- එය  මෙසේ පැහැදිලි කර දෙන්න.
    - ✓ වට්ටියේ තිබුණා  රබර් ඇට 5ක්.
    - ✓ වට්ටියෙන් ඉවත් කළා රබර් ඇට 2 ක්.
    - ✓ වට්ටියේ ඉතුරු ඉතුරු වුණා රබර් ඇට 3ක්
- මේ ආකාරයට කිහිප වරක් ද්‍රව්‍ය කිහිපයක් ඉවත් කර ඉතුරු ගණන සෙවීමට දරුවාට කියන්න .



# ද්‍රව්‍ය 20 ක් ගණන් කිරීම



**ක්‍රියාකාරකම – 1**

**දෙමාපියන්ට උපදෙස්-**

- ඉහත එක් වර්ගයකින් ද්‍රව්‍ය 10 ක් පෙට්ටියට දමන්න.
- එම ද්‍රව්‍ය මේසය මත , පේළියට තබන්න.
- මේසය මත තැබූ ද්‍රව්‍ය එකින් එකට ඇඟිල්ල තබමින් 1 සිට 10 තෙක් අනුපිළිවෙළින් ගණන් කිරීමට දරුවාට කියන්න .
- කිහිප වරක් 1 සිට 10 දක්වා අනුපිළිවෙළින් ගණන් කිරීමට දරුවා යොමු කරන්න.
- ද්‍රව්‍ය 10 ක් පෙට්ටියට දමන්න.
- 1 සිට 10 තෙක් ඇති ඕනෑම සංඛ්‍යාවක් පවසන්න.
- පැවසූ සංඛ්‍යාවට සමාන ද්‍රව්‍ය ගණනක් ,එකින් එක ගණන් කරමින් පෙට්ටියෙන්, ඉවතට ගෙන මේසය මත පේළියට තැබීමට දරුවාට කියන්න
- මේසය මත තැබූ ද්‍රව්‍ය එකින් එකට ඇඟිල්ල තබමින් නැවතත් අනුපිළිවෙළින් ගණන් කිරීමට දරුවාට කියන්න
- සංඛ්‍යා වෙනස් කරමින් කිහිප වරක් පවසන්න .
- ද්‍රව්‍ය එකින් එකට ඇඟිල්ල තබමින් අනුපිළිවෙළින් ගණන් කිරීමට දරුවාට අවස්ථාව ලබා දෙන්න.

**ක්‍රියාකාරකම– 2**

- ඉරටුවකට මල් 15ක් අමුණා ගන්න.
- එක් එක් මලට ඇඟිල්ල තබමින් 1 සිට 10 තෙක් අනුපිළිවෙළින් ගණන් කිරීමට දරුවාට අවස්ථාව ලබා දෙන්න.
- ගණන් කළ ස්ථානය තෙක් මල් “ කීය ද ” යි දරුවාගෙන් විමසන්න.
- 10 ට පසු තව එක මලක් පෙන්වමින් එකොළහ යැයි කිහිප වරක් පවසන්න.

- තව මලක් පෙන්වමින් දොළහ යැයි කිහිප වරක් පවසන්න.
- මෙසේ දහතුන, දහහතර, පහළොව තෙක් කිහිප වරක් පවසමින් ගණන් කරන්න.
- නැවත දරුවා සමඟ එකොළහ, දොළහ , දහතුන, දහහතර, පහළොව  තෙක් ගණන් කරන්න.
- අමුණන ලද මල් එකින් එකට ඇඟිල්ල තබමින්  1සිට 15 තෙක් අනුපිළිවෙළින් කිහිප වරක් ගණන් කිරීමට දරුවාට අවස්ථාව ලබා දෙන්න.
- පහත කොටුව තුළ කුඩා බෝල 15 ක් ඇඳ ඒවා පාට කිරීමට දරුවාට කියන්න.

| | | | | | | | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| | | | | | | | | | | | | | | |

- අඳින ලද බෝල එකින් එකට ඇඟිල්ල තබමින් 1 සිට  15 තෙක් අනුපිළිවෙළින් කිහිප වරක් ගණන් කිරීමට දරුවාට කියන්න.

**ක්‍රියාකාරකම - 4**


- වියළි කොස් කොළ  20 ක් පෙට්ටියකට  දමන්න.
- වරකට එක කොස් කොළය බැගින් ගෙන 1 සිට තෙක් 15 ගණන් කරමින් මේසය මත තබන්න යැයි දරුවාට පවසන්න .
- මේසය මත තැබූ  "කොස් කොළ ගණන කීය ද " යි දරුවාගෙන් විමසා පිළිතුර ලබාගන්න.
- පෙට්ටියෙන්  තව එක කොස් කොළයක් ගෙන මේසය මත තබා දහසය යැයි කිහිප වරක් පවසන්න.
- පෙට්ටියෙන් තව එක කොළයක් ගෙන මේසය මත තබා දහහත යැයි කිහිපවරක් පවසන්න.
- දහඅට, දහනවය විස්ස තෙක් ,පෙර පරිදිම කොස් කොළය බැගින් තබමින් ගණන් කරන්න.

- දරුවා සමග 16 සිට 20 තෙක් නැවත කිහිප වරක් ගණන් කරන්න.
- මේසය මත කොස් කොළ 20 ක් පේළියට තබන්න.
- කොස් කොළ එකින් එකට ඇඟිල්ල තබමින් 1 සිට 20 තෙක් කිහිප වරක් අනුපිළිවෙළින් ගණන් කිරීමට දරුවාට කියන්න.
- කොස් කොළ 20 එකින් එක ගණන් කරමින් ගෙන ,කොස් කොළ තොප්පියක් සෑදීමට දරුවාට උදව් කරන්න.


---

*1 ශ්‍රේණිය ගණිතය වැඩ පොතේ පිටු අංක 69, 70 ඇති අභ්‍යාස කිරීම සඳහා මඟ පෙන්වන්න.*

---




# 20 තෙක් රූප ගණන් කිරීම



## ක්‍රියාකාරකම 01 - ගණන් කරමු

**සපයා ගත යුතු දේ -**

- පහත දී ඇති රූප පත්‍රිකා විශාලනය කර ෆොටෝ කොපි (photocopy) කර ගැනීම හෝ වර්ණවත් කැලැන්ඩර කොළ, සඟරා, පුවත් පත් කොළවලින් එකම වර්ගයක රූප කපා පහත දී ඇති රටා ආකාරයට ම අලවා ගැනීම.



**දෙමාපියන්ට උපදෙස් -**

- රූප පත්‍රිකාවල ඇති රූප ප්‍රමාණය ගණන් කිරීමට දරුවාට කියන්න.
- නිවැරදි දැයි බලමු කියා නැවත එම රූප ගණන් කිරීමට කියා දරුවා ගණන් කරන විට ඒ ඒ රූප යටින් හරි (✓) ලකුණ බැගින් දමන්න.
- මේ ආකාරයට ඉතුරු රූප කාඩ්පත් වෙන වෙනම ප්රමාණවත් කාලය ලබා දෙමින් ගණන් කිරීමට දරුවාට කියන්න.
- උච්චාරණය කරන ආකාරය මෙසේ විය යුතුයි.

| | | | |
|---|---|---|---|
| ***එක*** | ***හය*** | ***එකොළහ*** | ***දහසය*** |
| ***දෙක*** | ***හත*** | ***දොළහ*** | ***දහහත*** |
| ***තුන*** | ***අට*** | ***දහතුන*** | ***දහඅට*** |
| ***හතර*** | ***නවය*** | ***දහහතර*** | ***දහනවය*** |
| ***පහ*** | ***දහය*** | ***පහළොව*** | ***විස්ස*** |

- උච්චාරණය වැරදි අවස්ථාවල දරුවා නිවැරදි වචනය උච්චාරණයට හුරු කරන්න

---



*ගණිතය වැඩ පොතේ පිටු අංක 68,69 හි ඇති අභ්‍යාස කිරීම සඳහා මඟ දරුවාට පෙන්වන්න.*

---

**ක්‍රියාකාරකම 02** - ගණන් කරමු

**සපයා ගත යුතු දේ -**


- පහත රූප පත්‍රිකා විශාලනය කර පොටෝ කොපි (photocopy) කර ගැනීම හෝ,
- පෙර පරිදි රූප කපා සකස් කර ගැනීම.
- බණ්ඩක්කා කරලක්, හබරල පිත්තක්, තීන්ත (කුකුල් සායම් /නිල් කුඩු /කහ කුඩුවලින් සකස් කර ගත්)
- භාවිතයෙන් රූප වෙනුවට සීල් මුද්‍රණය කර ගන්න.

**දෙමාපියන්ට උපදෙස් -**


- පෙර පරිදි ම හරි (✓) ලකුණ යොදමින් විසිරී ඇති රූප ගණන් කිරීමට යොමු කරන්න.
- බණ්ඩක්කා කෑල්ලක තීන්ත තවරා ගණන් කරමින් සීල් 18,15,17,20,16ක් තැබීමට යොමු කරන්න.

*ගණිතය වැඩ පොතේ පිටු අංක 70,71,72,73 හි ඇති අභ්‍යාස කිරීම සඳහා මඟ පෙන්වන්න.*



# කාසි හඳුනා ගැනීම හා ගනුදෙනු කිරීම





**ක්‍රියාකාරකම 01-** කාසි සොයමු

**සපයා ගත යුතු දේ-**

- සබන් දියරෙන් හොඳින් සෝදා ගත් රුපියල , රුපියල් දෙක , රුපියල් පහ යන කාසි
- හිස් භාණ්ඩ ඇසුරුම් 3 ක්
- කාඩ්බෝඩ් කැබලිවල අලවන ලද රුපියල , රුපියල් දෙක , රුපියල් පහේ, කඩදාසි මත අච්චු ගසන ලද කාසි

දෙමාපියන්ට උපදෙස්

- රුපියලේ කාසිය ගෙන මේසය මත තබන්න.
- එය රුපියලේ කාසිය බව දරුවාට හඳුන්වා දෙන්න.
- රුපියලේ කාසිය දරුවා අතට දෙමින් එම කාසියේ ප්‍රමාණය, පාට, දෙපැත්තේ ම සඳහන් වන දේවල් දෙස හොඳින් කිහිපවරක් බලමින් රුපියලේ කාසිය හඳුනා ගැනීමට අවස්ථාව ලබාදෙන්න .
- රුපියල් දෙකේ කාසිය දරුවාට දෙන්න .කාසියේ ප්‍රමාණය, පාට, කාසියේ දෙපැත්තෙහි ම සඳහන් වන දේවල් හොඳින් බලමින් රුපියල් දෙකේ කාසිය හඳුනා ගැනීමට අවස්ථාව ලබාදෙන්න .
- ඉන්පසු රුපියල් පහේ කාසිය ද ඉහත දැක් වූ පරිදි හඳුනා ගැනීමට අවස්ථාව ලබාදෙන්න.

## ක්‍රියාකාරකම 02 - කාසි සොයමු

- කාසි තුන ම මේසය මත තබන්න.
- ඔබ එක කාසියක වටිනාකම පවසන්න.
- එම කාසිය නිවැරදි ව හඳුනා ගෙන ඔබ "අතට දෙන්න" යි දරුවාට පවසන්න.
- එක කාසියකින් තවත් කාසියක් වෙන් කර හඳුනා ගැනීමට හැකි වන ආකාරයට කාසි තුන ම වරින් වර මාරු කර තබමින් මෙම ක්‍රියාකාරකමෙහි කිහිපවරක් යෙදෙන්න.

## ක්‍රියාකාරකම 03 - කාසි අච්චු ගසමු

- රුපියල මත කඩදාසියක් තබා අච්චු ගැසීමට දරුවාට උදවු කරන්න.
- කාසියේ අනිත් පැත්තද අච්චු ගසා ගන්න.
- මෙසේ රුපියල් දෙක , රුපියල් පහ කාසිවල දෙපැත්තම අච්චු ගසා ගන්න.( හැකි නම් පාට පැන්සල් යොදා ගන්න.)

## ක්‍රියාකාරකම 04 - අපි කඩයක් දමමු


- "අපි කඩයක් දමමු " යි දරුවාට පවසන්න.
- භාණ්ඩ ඇසුරුම් තුන මේසය මත තබන්න.
- ඒවා ඉදිරියෙන් රුපියල , රුපියල් දෙක හා රුපියල් පහ අච්චු ගසන ලද කාඩ්බෝඩ් තබන්න.
- දරුවාගේ අතට රුපියල , රුපියල් දෙක , රුපියල් පහ යන කාසි දෙන්න.
- දරුවාට තමා කැමති භාණ්ඩයක් මිලදී ගැනීමට අවස්ථාව ලබා දෙන්න .
- මිලදී ගන්නා භාණ්ඩය පෙන්වා එහි ලකුණු කර ඇති මිල කියවීමට දරුවාට කියන්න

- භාණ්ඩයේ සඳහන් මිල ගෙවීමට , නිවැරදි කාසිය ලබා දෙනවා දැයි බලන්න.
- ඇසුරුම්වල තබා ඇති මිල ගණන් වෙනස් කරමින් රුපියල , රුපියල් 2 , රුපියල් 5 යන කාසි නිවැරදි ව හඳුනා ගනිමින් ගනුදෙනු කිරීමට දරුවාට අවස්ථාව ලබා දෙන්න.

---

*ගණිතය 1 ශ්‍රේණිය ගණිතය වැඩ පොතේ පිටු අංක 75, 76 ඇති අභ්‍යාස කිරීම සඳහා දරුවාට මඟ පෙන්වන්න.*

---



# පරිසරයේ වෙනස්කම් ඇසුරින් කාලය හඳුනාගැනීම



**ක්‍රියාකාරකම 01** - ගීතයක් ගායනා කරමු

**සපයා ගත යුතු දේ -**

- උදය ,දවල්,රාත්‍රිය දැක්වෙන පින්තූර
- ඒවා නැතිනම් ගණිතය වැඩ පොතේ පිටු අංක 76හි ඇති පින්තූර.

**දෙමාපියන්ට උපදෙස් -**

- දරුවා සමග මේ ගීතය ගායනා කරන්න.

උදේම ඉර පායනවා - ලස්සන මල් පිපෙනවා

දත් මැද මුව සෝදාලා - අපි හැම පාසල් යනවා

ටික ටික දහවල් වෙනවා - අව්ව සැරට පායනවා

පාසල නිමවී අපි සැම - දවල්ට ගෙදරට එනවා

ඉර බැස ගොස් කළුවර වී - ටික ටික රෑ බෝ වෙනවා

වැඩ ඇරිලා ටොෆි අරගෙන - තාත්ත ගෙදරට එනවා

- උදෑසන දරුවා සමග මිදුලට ගොස් පරිසරයේ දැකිය හැකි දේ ගැන කතා කරන්න.
  - ✓ ඉර පායාගෙන එනවා
  - ✓ ගස්වල මල් පිපෙනවා
  - ✓ පාරේ මිනිස්සු වැඩට යනවා
  - ✓ කුරුල්ලෝ කූඩුවලින් එළියට ඇවිල්ලා කෑම සොයා යනවා ආදී ලෙස
  - ✓ කුරුල්ලන්ගේ ශබ්දවලට සවන්දීමට කියන්න.
- මේවා සැම උදෑසනක ම දකින්නට පුළුවන් බව කියා දෙන්න. සපයාගත් උදෑසන පින්තූරයේ ඇති දේ පිළිබඳ දරුවා සමග කතා කරන්න. උදය කාලයේ දුටු දේ චිත්‍රයට නගන්න.

**ක්‍රියාකාරකම 02 -**

**දෙමාපියන්ට උපදෙස් -**

- දහවල් කාලයේ පරිසරයේ දකින දේවල් හා ඇඟට දැනෙන රස්නය පිළිබඳ දරුවා සමඟ කතා කරන්න.
- ඉර අපගේ හිසට ඉහළින් අහසේ මුදුනට ඇවිත් බව පවසන්න.
- පාරේ යන අය අව්ව නිසා කුඩ ඉහලාගෙන යන ආකාරය පෙන්වන්න.
- පාසල නිම වෙන්නේ මේ වෙලාවට බව කියාදෙන්න.
- සපයා ගත් පින්තූරය පෙන්වා එහි පෙනෙන දේ කතා කරන්න.
- දහවල් කාලයේ පෙනෙන දේ චිත්‍රයක් ඇඳීමට කියන්න.

**ක්‍රියාකාරකම 03 -**


**දෙමාපියන්ට උපදෙස් -**

- රාත්‍රි කාලයේ දරුවා සමඟ මිදුලට යන්න.
- අවට පරිසරයේ දකින දේ පිළිබඳ කතා කරන්න.
- ඉර බැස ගොස් අඳුරු වී ඇති ආකාරය පෙන්වන්න.
- අහසේ හඳ, තරු, පායා ඇති ආකාරය පෙන්වන්න
- රෑට අහසේ පියාඹන කුරුල්ලන් සිටී නම් පෙන්වන්න.
- රාත්‍රි කාලයේ පින්තූර පෙන්වා ඒවායේ පෙනෙන දේ ගැන කතා කරන්න.
- "රාත්‍රි කාලය" චිත්‍රයක් ඇඳීමට යොමු කරන්න.


---

*ගණිතය වැඩ පොතේ පිටු අංක 76, 77 හි ඇති අභ්‍යාස කිරීම සඳහා මඟ පෙන්වන්න*

---




# එකතුව 9 තෙක් එකතු කිරීම




**සපයා ගත යුතු දේ-**

- ඔබට පහසුවෙන් සපයා ගත හැකි දේවල් තෝරා ගන්න.
  - ✓ පිරිසිදු කර ගත් කුඩා ගල් කැට 9 ක්
  - ✓ ඇට වර්ගයකින් 9 ක්
  - ✓ එකම වර්ගයේ මල් 9 ක් (එකම පාට)
  - ✓ බෝතල් මූඩි 9ක්
  - ✓ බොත්තම 9 ක්
  - ✓ කුඩා පෙට්ටි ක්2
  - ✓ 1සිට 9 තෙක් ලියූ සංඛ්‍යා කාඩ්පත්

| | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|
| 1 | 2 | 3 | 4 | 5 | 6 | 7 | 8 | 9 |

- ✓ සංකේත සහිත පත්‍රිකා කට්ටල | = | | + |
- ✓ | **එකතු කිරීම** | , | **සමානයි** | යන වචන ලියූ පත්‍රිකා
- ✓ පාට දෙකකින් මල් (එක වර්ගයකින් 5 බැගින්)
- ✓  රතු පාට රූප කාඩ්පත්

 නිල් පාට රූප කාඩ්පත්

## ක්‍රියාකාරකම 1

### දෙමාපියන්ට උපදෙස්-

- එකම  පාට මල් 5 ක් පෙට්ටියකට දමන්න.
- අනෙක් පාට මල් 5 අනෙක් පෙට්ටියට දමන්න.
- පෙට්ටි දෙක ම මේසය මත තබන්න.
- එක පෙට්ටියකින් දරුවා කැමති මල් සංඛ්‍යාවක් ගෙන මේසය මත තැබීමට දරුවාට කියන්න
- මේසය මත තැබූ මල් සංඛ්‍යාවට සමාන සංඛ්‍යා පත්‍රිකාව සොයා ඊට යටින් තැබීමට දරුවාට කියන්න.
- අනෙක් පෙට්ටියෙන් දරුවා කැමති මල් ගණනක් ගෙන මේසය මත තැබීමට කියන්න.
- මේසය මත තැබූ මල් සංඛ්‍යාවට සමාන සංඛ්‍යා පත්‍රිකාව තෝරා එම මල්වලට යටින් තැබීමට කියන්න.
- පෙට්ටි දෙකෙන් ඉවතට ගත් මල්වල එකතුව මෙසේ , පැවසීමට කියන්න.
  - ✓ තුන එකතු කිරීම පහ සමානයි අට යි.
- සකස් කරගත් පත්‍රිකා ඇසුරෙන් එය මෙසේ පැහැදිලි කරන්න.

3 එකතු කිරීම 5 සමානයි 8 යි

| | | | | |
|---|---|---|---|---|
| 3 | එකතු කිරීම | 5 | සමානයි | 8 |

**ක්‍රියාකාරකම 2**

- වෙනත් වර්ගයකින් ද්‍රව්‍ය 5 ක් පෙට්ටියකට දමන්න.
- එම ද්‍රව්‍යයෙන්ම 5 ක් අනෙක් පෙට්ටියට දමන්න.
- එක පෙට්ටියකින් කැමති ද්‍රව්‍ය ගණනක් ගෙන මේසය මත තැබීමට දරුවාට කියන්න.
- එම ද්‍රව්‍ය සංඛ්‍යාවට සමාන සංඛ්‍යා පත්‍රිකාවද ඊට යටින් තබන්න යැයි දරුවාට කියන්න.
- අනිත් පෙට්ටියෙන් ද්‍රව්‍ය ගණනක් ගෙන එයට සමාන සංඛ්‍යා පත්‍රිකාව ද ඊට යටින් තැබීමට දරුවාට කියන්න.
- පෙට්ටිවලින් ඉවතට ගෙන මේසය මත තැබූ ද්‍රව්‍යවල මුළු එකතුව ලබා ගැනීමට ඉහත පැහැදිලි කළ ආකාරයට පත්‍රිකා යොදා ගන්න.
- එකතුව නිවැරදිව පැවසීමට දරුවාට අවස්ථාව ලබා දෙන්න.

  ✓ ද්‍රව්‍ය වෙනස් කරමින් කිහිප වරක් ක්‍රියාකාරකම 1 හි සඳහන් ආකාරයට ද්‍රව්‍ය එකතු කර පිළිතුරු පැවසීමට දරුවාට අවස්ථාව ලබා දෙන්න.

**ක්‍රියාකාරකම 3**

- ඔබ දරුවාට ඉදිරියෙන් අසුන් ගන්න.
- සකස් කරගත් රතු පාට රූප සහිත කාඩ්පතක් අතට ගන්න.
- නිල් පාට කාඩ්පතක් අනිත් අතට ගන්න.
- අත්දෙකෙහි ඇති රූප සහිත කාඩ්පත් පෙන්වමින් දරුවාගෙන් මෙසේ විමසන්න.

  උදා: 5 එකතු කිරීම 2 සමානයි කීයද?

- කාඩ්පත් දෙකෙහි ඇති රූප ගණන් කර එකතුව පැවසීමට දරුවාට අවස්ථාව ලබා දෙන්න.

- මෙසේ පාට දෙකෙන් කාඩ්පත් දෙක බැගින් අත් දෙකට ගෙන පෙර පරිදි ප්‍රශ්න අසන්න .
- එකතුව ප්‍රකාශ කිරීමට දරුවාට අවස්ථාව ලබා දෙන්න. (අවශ්‍ය නම් එකතුව ලබා ගැනීම සඳහා ඇට වර්ග යොදා ගන්න.)

## ක්‍රියාකාරකම 4

- සකසා ගත් [ + ] කාඩ්පත දරුවාට පෙන්වන්න.
- මෙය එකතු කිරීමේ ලකුණ බව කිහිප වරක් පවසමින් [ + ] දරුවාට හඳුන්වා දෙන්න.
- [ = ] මෙය සමාන ලකුණ බව කිහිපවරක් පවසමින් සමාන ලකුණ හඳුන්වා දෙන්න .
- සංඛ්‍යා කාඩ්පත් හා පත්‍රිකා යොදා ගනිමින් මෙසේ පැහැදිලි කරන්න.

| | | | | |
|---|---|---|---|---|
| 1 | + | 1 | = | 2 |

1 එකතු කිරීම 1 සමානයි 2 යි.

- සංඛ්‍යා කාඩ්පත් වෙනස් කරමින් ,කිහිප වරක් ඉහත පරිදි පැහැදිලි කරන්න.

## ක්‍රියාකාරකම 5


- සකසා ගත් පත්‍රිකා ඇසුරෙන් පහත එකතු කිරීම් සඳහා පිළිතුරු ලබා ගැනීමට දරුවාට අවස්ථාව ලබා දෙන්න . (අවශ්‍ය නම් එකතුව ලබා ගැනීමට ඇට වර්ග යොදා ගන්න.)

| | | | | |
|---|---|---|---|---|
| 2 | + | 3 | = | |
| 5 | + | 2 | = | |
| 4 | + | 3 | = | |


---

*ගණිතය වැඩ පොතේ පිටු අංක 76, 77 හි ඇති අභ්‍යාස කිරීම සඳහා මඟ පෙන්වන්න .*

---



# 9 තෙක් වූ ද්‍රව්‍ය සංඛ්‍යාවකින් තවත් ද්‍රව්‍ය සංඛ්‍යාවක් අඩු කිරීම



**සපයාගත යුතු දේ -**

- පිරිසිදු කරන ලද ගල් කැට, මූඩි, යෝගට් හැඳි, සිප්පිකටු, ආදී විවිධ ද්‍රව්‍යවලින් 9 බැගින්
- ඒවා දැමීමට පිරිසිදු කළ පොල් කටු, හෝ කුඩා වට්ටි වැනි දේ

**දෙමාපියන්ට උපදෙස් -**

- සපයාගත් ද්‍රව්‍ය එක් එක් බඳුනට 9ක් ,8ක්, 7ක්, 6ක් ලෙස දමන්න.
- ඒ එක් එක් භාජනයේ ඇති ද්‍රව්‍ය ප්‍රමාණ ගණන් කිරීමට දරුවාට කියන්න.
- දැන් නැවත ගල් කැට දැමූ භාජනය ගන්න.
- නැවත එහි ඇති ගල්කැට ගණන කීය ද? යි අසන්න.
- එයින් ගල්කැට දරුවා කැමති ප්‍රමාණයක් ඉවත් කිරීමට දරුවාට කියන්න
- දරුවා මුලින් ගල් කැට 8ක් තිබී 4 ක් ඉවත් කළේ යයි සිතමු.
- එය මෙලෙස අහන්න.
    - ✓ ගල් කැට 8ක් තිබුණා. ඉන් 4ක් ඉවත්කළා ඉතුරු කීයද?
- ඉතුරු ගල් කැට ගණන ගණන් කර පිළිතුර අසන්න. පිළිතුර නිවැරදි විය යුතු නම් නිවැරදි කරන්න.
- මේ ආකාරයට ඒ ඒ භාජනවලින් කැමති ප්‍රමාණයක් ඉවත්කර ඉතුරු ගණන සෙවීමට දරුවාට කියන්න.
- මෙම ක්‍රියාකාරකම කිහිප වරක් කරන්න.

**ක්‍රියාකාරකම 02 -**

**දෙමාපියන්ට උපදෙස් -**

- කලින් ගත් සිප්පිකටු සහිත භාජනය ගන්න.
- එහි ඇති සිප්පිකටු ගණන ගණන් කිරීමට දරුවාට කියන්න.
- පසුව දරුවාට ඇස් වසා ගැනීමට කියන්න.
- දරුවාට නොපෙනෙන සේ භාජනයෙන් සිප්පි කටු කිහිපයක් ඔබේ අතමිට මොලවා සඟවාගන්න.
- දැන් දරුවාට  ඇස් ඇරීමට පවසන්න.
- භාජනයේ ඉතුරු සිප්පිකටු ප්‍රමාණය අනුව සැඟවූ සිප්පිකටු ගණන සෙවීමට දරුවාට කියන්න.
- මේ ක්‍රියාකාරකම වෙනත් ද්‍රව්‍ය සමග ද කිහිප වරක් කර අඩුකිරීම, ඉවත් කිරීම, අඩුවුණා යන වචන කීමට අවස්ථාව ලබා දෙන්න